# "රට දිනනා සිඟිත්තෝ"

## විදේශයන් හී සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ මෙරට වෙසෙන දරුවන් දක්වන දක්ෂතා සහ කුසලතා ඇගයීම

## තරඟ නීති රීති සහ කොන්දේසි

### පොදු තරඟ නීති රීති සහ කොන්දේසි

- මෙම තරඟාවලිය සඳහා සහභාගී විය හැක්කේ තම මව හෝ පියා හෝ මව හා පියා යන දෙදෙනාම හෝ විදේශයක සේවයේ නියුතු ලංකාවේ වෙසෙන, පූර්ව ළමා වියේ (පෙර පාසල් හා වයස අවුරුදු 5 න් පහල)හෝ පාසල් වියේ පසු වන (13 වන ශ්‍රේණියේ හෝ ඉන් පහල ඉගෙනුම ලබන) දූ දරුවන්හට පමණි.

- ප්‍රධාන වයස් කාණ්ඩ 6 ක් සහ ප්‍රධාන තරඟ කාණ්ඩ 4 ක් යටතේ මෙම තරඟ පැවැත්වෙන අතර එක් එක් වයස් කාණ්ඩ යටතේ තරඟකරුවන් සඳහා තරඟ අවස්ථා හිමිවන ආකාරය පහත පරිදි වේ.

| වයස් කාණ්ඩය (2022 දෙසැම්බර් 31 වන දිනට ඉගෙනුම ලබන ශ්‍රේණිය අනුව) | චිත්‍ර | ගායනා | නර්තන | ගද්‍ය රචනා | | |
|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | ඉංග්‍රීසි | දෙමළ |
| පෙර පාසල් හා වයස අවුරුදු 5 ට අඩු | √ | √ | √ | | | |
| 1 සහ 2 ශ්‍රේණි | √ | √ | √ | | | |
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | √ | √ | √ | √ | √ | √ |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | √ | √ | √ | √ | √ | √ |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | √ | √ | √ | √ | √ | √ |
| 12 සහ 13 ශ්‍රේණි | √ | √ | √ | √ | √ | √ |

- ගද්‍ය රචනා තරඟ සඳහා පමණක් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා වෙනුවෙන් වෙන වෙනම උප තරඟ කාණ්ඩයන් යටතේ තරඟ වැදීම සඳහා තරඟ අවස්ථාවන් සංවිධානය කර ඇත.

- ගද්‍ය රචනා තරඟය සඳහා පෙර පාසල් හා වයස අවුරුදු 5 ට අඩු කාණ්ඩය සහ 1 සහ 2 ශ්‍රේණි කාණ්ඩය යටතේ තරඟ නොපැවැත්වෙන අතර අනෙකුත් තරඟ කාණ්ඩයන් සඳහා සියලුම වයස් කාණ්ඩ යටතේ තරඟ පැවැත්වේ.

- ගායනා තරඟ සඳහා සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා වෙනුවෙන් වෙන වෙනම උප තරඟ කාණ්ඩයන් සංවිධානය **නොකරන** අතර භාෂාව සළකා බැලීමකින් තොරව සියලුම නිර්මාණ එකම කාණ්ඩයක් යටතේ සළකා බලනු ඇත.

- එක් තරඟකරුවෙකු හට, තම වයස් කාණ්ඩය යටතේ තරඟ කාණ්ඩ/ අවස්ථා කිහිපයකට වුවද සහභාගී විය හැක.

- ඍජුව හෝ වක්‍රව, කිසියම් ජන කොටසකට හෝ දේශීයත්වයට හානිකර හෝ, දේශපාලනික වශයෙන් පක්ෂපාතී හැඟීම් කුලු ගැන්වෙන හෝ දේශපාලනික හා සමාජීය වශයෙන් ප්‍රකෝපකාරී හැඟීම් දනවන නිර්මාණ ඉදිරිපත් කිරීම සපුරා තහනම් වන අතර එවන් නිර්මාණ කිසිදු සළකා බැලීමකින් තොරව තරඟයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

- ඉහත වයස් කාණ්ඩ යටතේ පැවැත්වෙන සෑම තරඟ අවස්ථාවක් සඳහාම පහත පරිදි සමස්ථ ලංකා මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ දිනුම් අවස්ථා හිමිවේ.
    - සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රාහකයින්
        - ප්‍රථම ස්ථානය
        - දෙවන ස්ථානය
        - තුන්වන ස්ථානය
    - දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයින්
        - ප්‍රථම ස්ථානය
        - දෙවන ස්ථානය
        - තුන්වන ස්ථාන

- පවතින COVID 19 වාතාවරනය යටතේ සියලුම තරඟ දරු දැරියන් ඒකරාශී කිරීමකින් තොරව සංවිධානය කරන අතර ඒ අනුව, සියලුම නිර්මාණ ඒ ඒ තරඟ කාණ්ඩයට අදාලව පහත උපදෙස් දී ඇති පරිදි හැටන් නැෂනල් බැංකුව වෙත යොමු කළ යුතුය.
    - චිත්‍ර සහ ගද්‍ය රචනා තරඟ
        - තරඟ නීති රීති සහ කොන්දේසි අනුව සම්පූර්ණ කරන ලද නිර්මාණ හා නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයට ("ඇමුණුම 2") අමුණා ලඟම පිහිටි හැටන් නැෂනල් බැංකු ශාඛාව වෙත භාර දිය යුතුය.
        - නැතිනම් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
          සහකාර සාමාන්‍ය අධිකාරී - ශාඛා ජාල කළමනාකරණ හා ව්‍යාපාර ප්‍රවර්ධන,
          ව්‍යාපාර ප්‍රවර්ධන අංශය, 19 වන මහල, අංක 479, HNB ප්‍රධාන කාර්යාලය, T B ජයා මාවත,
          කොළඹ 10.
    - ගායන සහ නර්තන තරඟ
        - නිර්මාණය වීඩියෝ දර්ශනයක් ලෙස අපවෙත ඉදිරිපත් කළ යුතුය
        - තරඟ නීති රීති සහ කොන්දේසි අනුව ඉදිරිපත් කරනු ලබන නිර්මාණයේ වීඩියෝ දර්ශනය, නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයක් ("ඇමුණුම 2") සමග 071 600 7778 අංකයට වට්ස් ඇප් (WhatsApp) යෙදුම හරහා යොමු කළ යුතුය.

- තරඟකරුවෙකු තරඟ කාණ්ඩ කිහිපයක් යටතේ තරඟවදින්නේ නම්, එක් එක් තරඟ කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම් පත් සම්පූර්ණකර නිර්මාණයන් සමග අප වෙත එවිය යුතුය.

- ගායනා හා නර්තන තරඟ සඳහා, නිර්මාණයන්ගේ වීඩියෝ දර්ශනය පටිගත කර එවීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතුය.
  - ඕනෑම ජංගම දුරකතනයක් හෝ වීඩියෝ කැමරාවක් පටිගත කිරීම සඳහා යොදාගත හැක.
  - ගායන නිර්මාණ සිරස් අතටත් නර්තන නිර්මාණ තිරස් අතටත් පටිගත කළ යුතුය.
  - වීඩියෝ පටයේ හඬ සහ දර්ශන පැහැදිලිව හඳුනා ගත හැකි තත්වයක පැවතිය යුතුය.
  - වීඩියෝ දර්ශනය **එකම පසුතලයක**, **නොනවත්වා** පටිගත කළ යුතුය.
  - කොටස් වශයෙන් පටිගත කරන ලද දර්ශන එකතු කර සංස්කරණය කිරීම **නොකළ යුතුය**.
  - වීඩියෝ පටයේ හඬ සහ දර්ශන, පරිගණක තාක්ෂණයෙන් හෝ වෙනත් කිසිදු තාක්ෂණයක් හෝ ක්‍රමෝපායක් යොදාගනිමින් වෙනස් කිරීම හෝ සංස්කරණය කිරීම **නොකළ යුතුය**.
  - පාසල් සංස්කෘතියට උචිත වන පරිදි ඇඳුම් පැළඳුම් වලින් සැරසී වීඩියෝ පටයට පෙනී සිටිය යුතුය.

- සියලුම නිර්මාණ 2023 මාර්තු 15 වන දිනට පෙර හැටන් නැෂනල් බැංකුව වෙත යොමු කළ යුතුය.

- එක් එක් තරඟ කාණ්ඩයන් සඳහා උචිත පරිදි අධ්‍යාපන අමාත්‍යංශයේ පාසල් කටයුතු අංශයේ හෝ සෞන්දර්ය අංශයේ හෝ භාෂා හා මානව ශාස්ත්‍ර අංශයේ හෝ ඉංග්‍රීසි හා විදේශ භාෂා අංශයේ හෝ මූලිකත්වයෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් විසින් නිර්මාණ ඇගයීමට ලක්කරන ලදුව ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ. මෙම විනිශ්චය මණ්ඩලය සඳහා හැටන් නැෂනල් බැංකුව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, SLT මොබිටෙල් හා HNB ඇෂුවරන්ස් ආයතනයන්ගේද සම්පත් දායකත්වය ලබා දෙනු ඇත.

- තෝරාගනු ලබන ජයග්‍රාහකයින්ගේ අනන්‍යතාවය හා ඔවුන්ගේ මව හෝ, පියා හෝ, මව හා පියා යන දෙදෙනාම හෝ, විදේශයක සේවයේ නියුතුදැයි යන්න තහවුරු කරගැනීමෙන් අනතුරුව ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කෙරේ.

- මෙම තරඟාවලිය පිළිබඳ වැඩි විස්තර අවශ්‍යවේ නම් www.hnb.net වෙබ් අඩවියට පිවිසෙන්න. නැතිනම් ඔබ පාසලට ලඟම පිහිටි හැටන් නැෂනල් බැංකු ශාඛාව හෝ 011 2 462 462 අංකයෙන් හැටන් නැෂනල් බැංකුවේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය අමතන්න.

- එක් එක් තරඟ කාණ්ඩයට විශේෂිත වූ උපදෙස්, තරඟ නීති රීති සහ කොන්දේසි පහත පරිදි වේ.

**තරඟ නීති රීති සහ කොන්දේසි - චිත්‍ර තරඟ**

- නිර්මාණය, ලබා දී ඇති තේමාවට අනුකූල විය යුතුය.
- පටු ආගම්වාදී හෝ ජාතිවාදී හැඟීම් වලට තුඩුනොදෙන සේ කරන ලද නිර්මාණ විය යුතුය.
- ඕනෑම මාධ්‍යයක් බාවිතා කළ හැක (පැස්ටල්, තෙල්සායම්, දියසායම් ආදී ඕනෑම මාධ්‍යයක්)
- නිර්මාණය, ප්‍රකාශන චිත්‍රයක් විය යුතුය.
- අඟල් 18 x 14 ප්‍රමාණයේ කොළයක් භාවිතා කළ යුතුය.

| වයස් කාණ්ඩය | තේමාව |
|---|---|
| පෙර පාසල් හා වයස අවු. 5 ට අඩු | තම අභිමතය පරිදි සුදුසු තේමාවක් යටතේ චිත්‍ර නිර්මාණය කළ හැකිය |
| 1 සහ 2 ශ්‍රේණි | දෙමාපියන්ගේ ගුණ හෝ පරිසරය තේමා කරගත් චිත්‍ර නිර්මාණයක් |
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | විදේශ රැකියාවක නියුතු තම මව/ පියා, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වන අයුරු පෙන්වන චිත්‍ර නිර්මාණයක් හෝ විදේශ රැකියාවක නියුතු තම මව/ පියා, තම අධ්‍යාපනයට හා අනාගතයට ශක්තියක් වන අයුරු පෙන්වන චිත්‍ර නිර්මාණයක් |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | |
| 12 සහ 13 ශ්‍රේණි | |

**ලකුණු දීමේ නිර්ණායක**

- මාතෘකාවට උචිත වාතාවරණය සහ පරිසරය දැක්වීම
- අවකාශය මත රූප සංරචනය කර ඇති ආකාරය
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය
- මාධ්‍ය හා ශිල්පක්‍රම භාවිතයේ කුසලතාවය
- භාව ප්‍රකාශනය සහ ප්‍රශස්ථ නිමාව

**<u>තරඟ නීති රීති සහ කොන්දේසි - ගායනා තරඟ</u>**

- මෙම තරඟය සඳහා පහත දී ඇති වයස් කාණ්ඩ යටතේ දරු දැරියන්ට සුදුසු ගීතයක් (ඒකලව) ගායනයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත.
- ගායන සඳහා, ප්‍රචලිත එක් ගීතයක් පමණක් තෝරාගත යුතුය. (ස්වතන්ත්‍ර නිර්මාණ ඉදිරිපත් නොකළ යුතුය)
- පහත වයස් කාණ්ඩ යටතේ වෙන වෙනම තරඟ අවස්ථා සංවිධානය කර ඇති අතර, ඒ යටතේ ලබා දී ඇති තේමාවන්ට අනුගතව ගීත තෝරාගත යුතුය
- ගැහැණු - පිරිමි වශයෙන් වර්ගීකරණය නොකෙරේ.
- භාෂා අනුව වර්ගීකරණය නොකෙරේ.
- පටු ආගම්වාදී හෝ ජාතිවාදී අදහස් මතු නොවන ගීතයක් තෝරාගත යුතුය.
- පසුබිම් සංගීතය හා සහය වාදනය සඳහා සජීවී වාදන හෝ පටිගත කරන ලද සංගීත වාදන වලට අනුකූලව ගායනය ඉදිරිපත් කළ හැකිය
- වීඩියෝ පටය, සකස් කිරීමේදී මෙම චක්‍රලේඛයේ සඳහන් වීඩියෝ පට සඳහා වන පොදු උපදෙස් වලට අනුගත විය යුතුය.

| වයස් කාණ්ඩය | තේමාව |
|---|---|
| පෙර පාසල් හා වයස අවු. 5 ට අඩු | දරුවන්ට උචිත තේමාවක් යටතේ ප්‍රචලිත ළමා ගීතයක් |
| 1 සහ 2 ශ්‍රේණි | දරුවන්ට උචිත තේමාවක් යටතේ ප්‍රචලිත ළමා ගීතයක් |
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | යහපත් පුරුදු තේමා කරගත් ප්‍රචලිත ළමා ගීතයක් |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | සොබාදහම හෝ පරිසරය තේමා කරගත් ප්‍රචලිත සරළ ගීතයක් |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | මව්පිය ගුණ තේමා කරගත් ප්‍රචලිත සරළ ගීතයක් |
| 12 සහ 13 ශ්‍රේණි | දේශාභිමානය තේමා කරගත් ප්‍රචලිත ගීතයක් |

**<u>තරඟ නීති රීති සහ කොන්දේසි - නර්තන තරඟ</u>**

- ගැහැණු - පිරිමි වශයෙන් බෙදා වෙන් නොකෙරේ.
- භාෂා අනුව බෙදා වෙන් නොකෙරේ.
- සියලුම නර්තන තරඟ ඒකල වේ.
- නිර්මාණය, ලබා දී ඇති තේමාවට අනුකූල විය යුතුය.
- පාසල් සංස්කෘතියට උචිත වන පරිදි ඇඳුම් පැළඳුම් සකස් කළ යුතුය.
- වීඩියෝ පටය, සකස් කිරීමේදී මෙම චක්‍රලේඛයේ සඳහන් වීඩියෝ පට සඳහා වන පොදු උපදෙස් වලට අනුගත වියයුතුය.
- පටු ආගම්වාදී හෝ ජාතිවාදී හැඟීම් වලට තුඩුනොදෙන සේ කරන ලද නිර්මාණ විය යුතුය,
- ලබා දී ඇති තේමාවට සරිලන සජීවී ගායනයක්, සජීවී වාදනයක් හෝ පටිගත කරන ලද හඬ පටයක් පසුබිම් සංගීතය ලෙස භාවිතා කළ හැක
- පෙර පාසල් හා වයස අවුරුදු 5 න් පහල කාණ්ඩයේ නර්තන නිර්මාණයන් උපරිම විනාඩි 3 කට සීමා විය යුතු අතර අනෙකුත් වයස් කාණ්ඩයන්ගේ නර්තන නිර්මාණයන් උපරිම විනාඩි 4 කට සීමා විය යුතුය.
- ලබාදී ඇති උපරිම කාලය තුල නර්තනය ඉදිරිපත් කළ යුතුය.

| වයස් කාණ්ඩය | තේමාව |
|---|---|
| පෙර පාසල් හා වයස අවු. 5 ට අඩු | ළමා නර්තනයක් (සුදුසු ළමා ගීතයක් තෝරාගෙන, අදහස් ප්‍රකාශ වන අයුරින් ඉදිරිපත් කළ යුතුය) |
| 1 සහ 2 ශ්‍රේණි | සුදුසු ළමා ගීතයක් තෝරාගෙන, අදහස් ප්‍රකාශ වන ආකාරයේ නර්තන නිර්මාණයක් |
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | ගුරුතුමා හෝ ගුරුතුමිය ගැන කියැවෙන සුදුසු ළමා ගීතයකට නර්තන නිර්මාණයක් |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | දෙමාපියන් තේමා කරගත් නිර්මාණාත්මක නර්තනයක් |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | දේශාභිමානය ප්‍රකාශවන පරිදි නිර්මාණාත්මක නර්තනයක්. සුදුසු ගීතයක් තෝරා ගත හැක |
| 12 සහ 13 ශ්‍රේණි | ඕනෑම නර්තන ශෛලියක් හෝ කිහිපයක් යොදාගෙන ප්‍රාසාංගික නර්තනයක් |

**ලකුණු දීමේ නිර්ණායක**

- තේමාවට ගැළපෙන බව
- ප්‍රාසාංගික බව
- උචිත නර්තන චලන භාවිතය
- රංග වින්‍යාසය
- ගායන, වාදන, නර්තන සංකලනය

**<u>තරඟ නීති රීති සහ කොන්දේසි - ගද්‍ය රචනා තරඟ</u>**

**සිංහල හා දෙමළ භාෂා සඳහා**

- එක් එක් වයස් කාණ්ඩ යටතේ නිර්මාණ සඳහා යොදාගත යුතු තේමාවන් හා තිබිය යුතු වචන ප්‍රමාණයන් පහත පරිදි වේ.

| වයස් කාණ්ඩය | වචන ප්‍රමාණය | තේමාවන් |
|---|---|---|
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | වචන 25 - 30 අතර (මාතෘකාවට අදාල අර්ථවත් වාක්‍ය 5ක්) | • මගේ අම්මා<br>• මගේ තාත්තා<br>• මගේ රට |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | වචන 200 - 300 අතර | • ලොවේ උතුම් රට ලංකාවයි<br>• එතෙර වෙහෙසී මෙතෙර දිනවන මගේ අම්මා/ මගේ තාත්තා<br>• එතෙර වෙහෙසෙන මගේ අම්මාගේ/තාත්තාගේ අනාගත අභිමානය මම වෙමි |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | 300 - 400 ට නොඅඩු | • එතෙර වෙහෙසී මෙතෙර දිනවන මගේ අම්මා/ මගේ තාත්තා<br>• එතෙර වෙහෙසෙන මගේ අම්මාගේ/තාත්තාගේ අනාගත අභිමානය මම වෙමි |
| 12 සහ 13 ශ්‍රේණි | 450 - 500 ට නොඅඩු | • විදෙස් විනිමය රටට ගෙන එන නව මං සොයමු<br>• රට දිනවන්නට විදෙස් විනිමය නිසි ලෙස කළමනාකරණය කරමු |

**ලකුණු ලබා දීමේ පටිපාටිය**

| 3 සිට 5 දක්වා ශ්‍රේණි සඳහා වන කාණ්ඩය සඳහා | අනෙකුත් වයස් කාණ්ඩ සඳහා | ලබාදෙන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මාතෘකාවට අදාල අදහස් ප්‍රකාශ කිරීම | මාතෘකාවට අදාල සාරවත් අදහස් (අන්තර්ගතය) | 15 |
| නිවැරදි උක්තාඛ්‍යාත පද සම්බන්ධය | භාෂා රීතීන් අනුගමනය (උක්තාඛ්‍යාත පද සම්බන්ධය, අක්ෂර වින්‍යාසය) | 15 |
| අක්ෂර වින්‍යාසය හා පද බෙදීම | ශිල්පීය දක්ෂතා (පද බෙදීම, ඡේද වෙන් කිරීම, විරාම ලක්ෂණ හා අත් අකුරු) | 10 |
| අකුරුවල නිවැරදි හැඩය | ප්‍රකාශන ශක්තිය හා සමස්ථ අගය | 10 |
| මුළු ලකුණු | මුළු ලකුණු | 50 |

**ඉංග්‍රීසි භාෂාව සඳහා**

- එක් එක් වයස් කාණ්ඩ යටතේ නිර්මාණ සඳහා යොදාගත යුතු තේමාවන් හා තිබිය යුතු වචන ප්‍රමාණයන් පහත පරිදි වේ.

| වයස් කාණ්ඩය | වචන ප්‍රමාණය | තේමාව/ මාතෘකාව |
|---|---|---|
| 3 සිට 5 දක්වා ශ්‍රේණි | වචන 25 - 30 අතර (මාතෘකාවට අදාල අර්ථවත් වාක්‍ය 5ක්) | • My mother<br>• My father<br>• My country |
| 6 සිට 8 දක්වා ශ්‍රේණි | වචන 150 - 200 අතර | • Sri Lanka is the greatest country in the world<br>• My father/ My mother working hard abroad to blossom our mother land<br>• I am the future pride of my parents who are working hard obroad |
| 9 සිට 11 දක්වා ශ්‍රේණි | වචන 200 - 250 අතර | • My father/ My mother working hard abroad to blossom our mother land<br>• I am the future pride of my father/ my mother who work hard for the country |
| 12 සහ 13 ශ්‍රේණි | වචන 250 - 300 අතර | • Let's find innovative avenues of Foreign Exchange generation<br>• Better management of Foreign Exchange for a better Sri Lanka |

**ලකුණු ලබා දීමේ පටිපාටිය**

| නිර්ණායකය | ලබාදෙන ලකුණු ප්‍රමාණය |
|---|---|
| නිර්මාණාත්මක බව/ ස්වතන්ත්‍ර බව | 40 |
| සංවිධානාත්මක බව/ සුසංයෝගය | 30 |
| ව්‍යාකරන හා අක්ෂර වින්‍යාසය | 20 |
| මාතෘකාවට අදාල බව | 10 |
| මුළු ලකුණු | 100 |